# 17



# සහය මූලාශ්‍රය



මුස්ලිම් කෙනෙක් ආගමික නීතිරීතිවලට අනුකූල ව ජීවත් වීම අනිවාර්ය වේ. එසේ ජීවත් වීමට අනුගමනය කළ යුතු ප්‍රධාන මූලාශ්‍රයය ලෙස අල් කුර්ආනය සහ සුන්නාව යන දෙක සැලකේ. මෙම ප්‍රධාන මූලාශ්‍රය දෙක තුළ ලෝකය අවසානය දක්වා එළඹෙන සියලු ම ගැටලුවලට විසඳුම් සොයා ගත හැකි මූලික සිද්ධාන්ත ගැබ් වී ඇත. මේවා උපයෝගී කොට නිර්මාණය කළ මූලාශ්‍ර උපකාරක මූලාශ්‍ර වෙයි. මේ තුළ ගැබ් වී ඇති මූලාශ්‍රය දෙක නම් ඉජ්මාඋ හා කියාස් වෙයි.

## ඉජ්මාඋ

ඉජ්මාඋ නම් අරාබි වදනේ නිර්වචනය එකමුතු කිරීම යි, ස්ථිරත්වයට එළඹීම තුළ ඒකමතික තීරණයට අවතීර්ණ වීම යි.

මේ අනුව ඉස්ලාමීය ව්‍යවහාරයේ දී ඉජ්මාඋ 'ඒකමතික තීරණය' ලෙස හැඳින්විය හැකි ය. ඉජ්මාඋ නීති මූලාශ්‍රයයක් ලෙස අනුගමනය කළ හැකි බවට අල් කුර්ආනය සහ සුන්නාව යන දෙකෙන් ඉඩකඩ සලසා ඇත.

1. යම් කෙනකු යහ මග ගැන තමාට අවබෝධ වූ පසු ව ද අල්ලාහ්ගේ මෙම දූතයා ගැන නොතකා මුඃමින්වරු නොයන මග ගමන් කළොත් ඔහු යන මග යන්න දී අපායට ද යාමට ඉඩ හරිමු. එය ඉතා ම භයානක ස්ථානයකි. (4:115)

2. අල්ලාහුතආලා මාගේ සමාජය නොමග යාමට නොහරියි. (තිර්මිදි)

ඉජ්මාඋ යනුවෙන් හඳුන්වනුයේ නබි (සල්) තුමාගේ අභාවයෙන් පසු පැන නැගෙන ආගමික ගැටලු අල් කුර්ආනයේ සහ සුන්නාවේ සඳහන් නොවූ අවස්ථාවල දී එවකට ජීවත් වූ මුජ්තහිද්වරුන් විසින් ඒකමතික ව එළඹෙන තීරණ වේ.

මෙම කරුණු හේතු කොට ගෙන :-

- ★ මුස්ලිම් සමාජය නොමග යාමෙන් වැළකී තිබේ.
- ★ මුඃමින් වරුන්ගේ මග ඒකමතිකව තීරණය වූ මග වේ.
- ★ ඒකමතික තීරණයට අවනත නොවීම අල්ලාහ්ගේ දූතයා පිටු දැකීමට සමාන වේ.
- ★ අල්ලාහ්ගේ දූතයා සහ මුඃමින්වරු පිටුදකිමින් හුදකලා මග ගමන් කරන්නා අපායට ගොඩ වෙයි.

මේ ගැන සැලකීමේ දී ඉජ්මාඋ ඉතා ම වැදගත් නීති මූලාශ්‍රයයක් ලෙස පෙනී යනු ලැබේ.

ඉජ්මාඋ පිළිගෙන ඒ මග ගමන් කරන්නාට යහපතක් සිදු වෙයි.

1. සමාජයේ සමගිය රැකෙයි.
2. සමාජයේ හික්මීම බිඳ නොවැටෙයි.
3. එකිනෙකාට උදව් උපකාර ලබා ගැනීමේ අවකාශය සැලසෙයි.

මුජ්තහිද්වරුන් ඉජ්මාඋ විවිධ අංශවලට බෙදා පැහැදිලි කර ඇත. ඒවායින් වැදගත් යැයි සැලකෙන කිහිපයක් පහත දැක්වෙයි.

**1. ඉජ්මාඋස් සරීහ් :-**

පැහැදිලි ඉජ්මාඋ යනුවෙන් මෙය හැඳින්විය හැකි ය. නිශ්චිත කාලයක දී ජීවත් ව සිටින සියලු ම මුජ්තහිද්වරුන් ඒකමතික තීරණයකට එළඹුණ බව ඔවුන්ගේ වාග් මාලාවලින් හෙළි වූ විට එම තීරණය මෙසේ හඳුන්වනු ලැබේ. මෙය "ඉජ්මාඋල් කෞලි" යනුවෙන් ද හැඳින්වෙයි.

**2. ඉජ්මාඋල් අක්සරිය්යා :-**

බහුතරයකගේ තීරණයට මෙසේ කියනු ලැබේ. යම් ගැටලුවක දී මුජ්තහිද්වරුන් බහුතරයකගේ තීරණය මෙයින් ප්‍රකාශ වේ.

**3. ඉජ්මාඋශ් සුකූති :-**

නිශ්ශබ්ද වූ ඉජ්මාඋ යනුවෙන් මෙය හැඳින්වෙයි. නිශ්චිත කාල සීමාවක් තුළ ජීවත් වන මුජ්තහිද් වරුන්ගෙන් කෙනකුගේ හෝ එළඹෙන තීරණයකට කැමැත්ත හෝ අකමැත්ත ප්‍රකාශ නොකර නිහඬව සිටීමට මෙසේ කිව හැකි ය. මෙම තීරණය නිවැරදි යැයි නිගමනයකට පැමිණිය නොහැකි බව ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා ප්‍රකාශ කරයි. මාලික් මද්හබයට අයත් බහුතරයක් විද්වත්හු මෙය නිවැරදි යැයි පවසති.

## කියාස්

නවීන මූලාශ්‍රයවලින් අධික ලෙස උපයෝගී කරගන්නා, ක්‍රියාවට නඟන එක් මූලාශ්‍රයයක් ලෙස සැලකිය හැක. මෙහි නිර්වචනය අරාබි භාෂාවෙන් සසඳා බැලීම සහ අනුමාන කිරීම වැනි අරුත්වලින් භාවිත වේ. අල් කුර්ආනය හා සුන්නාවෙහි සඳහන් නොවන ගැටලුවක් මතු වූ විට එය අල් කුර්ආනයේ සුන්නාවෙහි තීරණය හෝ විසඳුම සඳහන් වූ ගැටලුවක් සමග සසඳා බලා එම තීරණය හෝ විසඳුම නව ගැටලුවට විසඳුමක් ලෙස භාවිත කිරීම මෙම වචනයෙන් පිළිබිඹු වේ. එනම් ඉස්ලාමීය ගැටලුවල දී නිගමනයකට එළඹිය නොහැකි අලුත් ගැටළුවක් නම් එය අල් කුර්ආනය සහ සුන්නා යන දෙක ම උපයෝගී කරගෙන ලබාගත් තීරණය නව ගැටලු වලට ද යොමු කිරීම යි. මෙසේ තීරණ ගැනීමේ දී එකමුතුකමක් පිළිබිඹු විය යුතු ය.

කියාස් පහත සඳහන් අනුමැතිය ලත් මූලික කරුණු හතරට සීමා වී තිබේ. මේවා "අර්කානුල් කියාස්" යනුවෙන් හඳුන්වනු ලැබේ.

### 1. අල් අස්ල් :-

මීට පෙර තිරණය දෙන ලද ගැටලුවට මෙසේ පවසයි. උදා: මිනීමරුවාට උරුමක් කාරයෙක් විය නොහැකි ය. (තිර්මිදි) යනුවෙන් නබි (සල්) තුමා පවසා ඇත. පරම්පරාගත දායාදයක් ලැබීමට හිමිකම් ඇති පුද්ගලයා එම බූදලය හිමි කරු ඝාතනයකර ඇත් නම් ඔහුට හිමි දේපළහි හිමිකම ලැබීමට අයිතියක් නොමැත.

### 2. අල් ෆරළ :-

අල් කුර්ආනය හෝ සුන්නාවේ හෝ ඉජ්මාවේ හෝ තීරණය නොදක්වා ඇති තීරණය ගත යුතු ව නිරාකරණය නොවූ ගැටලුව මෙසේ හඳුන්වනු ලැබේ. උදාහරණ වශයෙන් "වසීයත්" එනම් අන්තිම කැමැත්තෙන් දේපළ හිමි වන පුද්ගලයා දේපළ ලබා දෙන වසීයත් කරන ලද පුද්ගලයාව ඝාතනය කර ඇත්නම් වසීයත් ලද පුද්ගලයාට දේපළ හිමි විය යුතු ද, යන්න නිගමනයකට එළඹ නොමැති ගැටලුවකි.

### 3. අල් ඉල්ලත් :-

ගැටලු දෙකක් අතර තිබෙන්නා වූ පොදු ගුණාංග හෝ පොදු කරුණු ඉල්ලත් නම් වෙයි. ඉහත අවස්ථා දෙකේ දී ම ඇති පොදු ගුණාංගය වනුයේ දේපළ ලබා ගැනීට ඇති හදිස්සිය වේ.

### 4. අල් හුකුම් :-

අල් කුර්ආන් සහ සුන්නාවෙන් ලබා ගත් තීරණය මෙසේ හඳුන්වයි. මුදල් ලබා ගැනීමට ඝාතනයට යොමු වූ දරුවන්ට එම දේපළ ලබා නොදිය යුතු යැයි හුකුම් පවසයි.

ඉහත සඳහන් කරුණුවලට අනුව ඉක්මනින් දේපළ ලබා ගැනීමේ චේතනාවෙන් වසීයත් කළ පුද්ගලයා ඝාතනය කිරීම නිසා ඝාතකයාට වස්තු හිමි වන්නේ නැත,යන තීරණය ලබා දෙයි. මෙය කියාස් මූලික කර ගෙන ගත් තීරණයක් වෙයි. කියාස් නීති මූලාශ්‍රයයක් ලෙස සැලකිය හැකි බවට බොහෝ සාධක තිබේ. ඒවායින් තුනක් පහත දැක්වේ.

1. හජ් වාජිබ් වූ මරණයට පත් වූ පියා වෙනුවෙන් හජ් කළ හැකි ද, යනුවෙන් කාන්තාවක් ඇසී ය. "ඔබගේ පියා ණයක් දෙන්න තිබුණ කෙනකුට එම ණය මුදල ඔබ ගෙව්වොත් ඔබේ පියාට එය ප්‍රයොජනවත් වෙයි ද, යනුවෙන් නබි (සල්)තුමා ඇසී ය. එවිට එම කාන්තාව 'ඔව්'කීවා ය. එසේ නම් අල්ලාහු තආලාට ගෙවීමට ඇති ණය ගෙවීම වඩා උචිත වේ'' යනුවෙන් නබි (සල්) තුමා පැවසී ය.

2. සහාබාවරු නොයෙක් අවස්ථාවල කියාස් මූලාශ්‍රයය කරගෙන නොයෙක් තීරණවලට එළඹියහ. උදාහරණ වශයෙන් නබි (සල්) තුමා රෝගාතුර ව සිටින අවස්ථාවේ සලාතයට ඉමාම් වශයෙන් අබූබක්කර් (රළි) තුමා කටයුතු කළේ ය. එතුමාගේ එම ක්‍රියාව මුල් කරගෙන සහාබාවරුන් නබි (සල්) තුමාගේ අභාවයෙන් පසු කලීෆා වශයෙන් ඔහු පත් කළෝ ය. විචක්ෂණ බුද්ධිය කියාස් වන්නේ ය. එනම් අල් කුර්ආන මත්පැන් හරාම් කර තිබේ. එනමුත් ඒ වගේ හෝ ඊටත් වඩා නරක දේවල් ගැන සඳහන් වී නැත. කියාස් නොපිළිගන්නේ නම් මත්පැන් පමණක් හරාම් වෙයි. එනමුත් විචක්ෂණ බුද්ධිය තුළින් සියලු ම මත්ද්‍රව්‍ය හරාම් වශයෙන් හැඳින්විය හැකි ය.

මනුෂ්‍ය සමාජය දිනෙන් දින විවිධ ක්ෂේත්‍ර තුළින් දියුණු වෙමින් පවතී. මෙම දියුණුව නව ගැටළු බිහි කිරීමට ද හේතු විය. ඒවාට ද නිසි පිළිතුරු අල් කුර්ආනයේ සහ සුන්නාවෙහි දැක්වෙයි. එම නිසා ඒවායේ ආලෝකයෙන් මෙම ප්‍රශ්න වලට තීරණ ගැනීමට අවශ්‍ය වී ඇත.

එයට උපයෝගී වන වැදගත් මූලාශ්‍රයයක් ලෙස කියාස් පත් වේ. එලෙස ඉස්ලාමය සියලු ම කාලවලට අදාල ගැටළු වලට පිළිතුරු දීමට කියාස් ඉමහත් උපකාරයක් වී ඇත.
ඉජ්මාඋ සහ කියාස් හැර වෙනත් මූලාශ්‍රය හයක් පහත දැක්වෙයි.

ඒවා නම් ::

1. ඉස්තිහ්සාන්
2. ඉස්තිස්හාබ්
3. ඉස්තිස්ලාහ් (මස්ලහා මුර්සලා)
4. උර්ෆ්
5. අෂ්ෂරාඉඋස් සාබිකා
6. කව්ලුස් සහාබි

සමස්තයක් වශයෙන් මූලාශ්‍රය සියල්ල නීති ක්ෂේත්‍රයේ පැන නගින ගැටලුවලට විසඳුම් ලබා ගැනීමට උපකාර වනවා මෙන් ම සියලු කාල වකවානුවලට ඉස්ලාමය නම්‍යශීලීභාවයක් දක්වයි, යන්නට සාක්ෂි දරයි.

**අභ්‍යාස**

1. ඉජ්මාඋ යනු කුමක් ද?

2. ඉජ්මාඋ වල වර්ග හඳුන්වන්න.

3. ඉජ්මාඋවෙහි ප්‍රයොජන දෙකක් පෙන්වා දෙන්න.

4. අර්කානුල් කියාස් විස්තර කරන්න.

5. උපකාරක මූලාශ්‍රය සියල්ල පෙළගස්වන්න.